සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2017 ජනවාරි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2017-01-28
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන්,* ***එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *ප්‍රස්තාර කොළ සපයනු ලැබේ.*

(7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(8) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 සැපයුම් නීතියෙන් පැහැදිලි කෙරන්නේ:

(1) සැපයුමේ වෙනස්වීම සහ ආදායමේ වෙනස්වීම අතර සම්බන්ධතාවයයි.

(2) මිල සහ සපයනු ලබන ප්‍රමාණය අතර සම්බන්ධතාවයයි.

(3) සපයනු ලබන ප්‍රමාණයේ වෙනස්වීම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වෙනස්වීම අතර සම්බන්ධතාවයයි.

(4) සපයනු ලබන ප්‍රමාණය සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර සම්බන්ධතාවයයි.

**1.2** රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පහත සඳහන් රූප සටහනෙන් පෙන්නුම් කරයි:




ඉහත රූපසටහනේ *x* ලක්ෂ්‍යයෙන් පෙන්නුම් කෙරෙන්නේ:

(1) සම්පත්වල ඌන උපයෝජනයයි.

(2) භාණ්ඩවල ළඟා කරගත නොහැකි සංයෝගයකි.

(3) සම්පත්වල පූර්ණ සේවා නියුක්තියයි.

(4) අනාගත ආර්ථික වර්ධනයේ වේගවත් අනුපාතිකයකි.

**1.3** භාණ්ඩයක ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත සඳහන් රූප සටහනෙන් පෙන්නුම් කරයි:




පාරිභෝගික අතිරික්තය වන්නේ:

(1) රු.250/- (2) රු.500/- (3) රු.650/- (4) රු.750/-

**1.4** තේ මිල 8% කින් පහළ වැටුනු විට, කෝපි සඳහා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය 2% කින් අඩුවේ. කෝපි සහ තේ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය වන්නේ:

(1) - 0.25 (2) + 2.0 (3) + 4.0 (4) + 0.25

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, වක්‍ර බදු පැනවීමේ අරමුණක් වන්නේ කුමක් ද?

(1) රජය සඳහා බදු ආදායම් උපයා ගැනීමයි.

(2) අහිතකර නිෂ්පාදන පරිභෝජනය කිරීම අධෛර්යමත් කිරීමයි.

(3) ඇතැම් භාණ්ඩ පරිභෝජනය කිරීම ධෛර්යමත් කිරීමයි.

(4) ඉහත සඳහන් සියල්ලම වේ.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, පොදු භාණ්ඩ වල ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) පරිභෝජනයේ තරඟකාරිත්වයක් ඇතිවීම. (2) බැහැරකිරීමේ නොහැකියාව.

(3) භාණ්ඩයේ ලාභදායකත්වය. (4) පෞද්ගලික අංශය මගින් නිපදවීම.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, රාජ්‍ය අයවැය ලේඛනයක ප්‍රධාන අරමුණක් **නොවන්නේ** කුමක් ද?

(1) සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීම. (2) දළ දේශීය ඉතිරිකිරීම් වැඩි වීම.

(3) ආදායම් ප්‍රතිව්‍යාප්තියක් ඇති කිරීම. (4) ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යාම.

1.8 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, 2015 වර්ෂයෙහි ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වූයේ:

(1) ඇමරිකානු ඩොලර් 3,280 කි. (2) ඇමරිකානු ඩොලර් 3,924 කි.

(3) ඇමරිකානු ඩොලර් 2,900 කි. (4) ඇමරිකානු ඩොලර් 3,700 කි.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, ජාතික ආදායමේ වෘත්ත ප්‍රවාහයෙන් ගිලිහීමක් / කාන්දු වීමක් (leakage) වන්නේ කුමක් ද?

(1) ආයෝජන. (2) ඉතිරිකිරීම්. (3) රජයේ වියදම්. (4) අපනයන.

1.10 ආර්ථිකයක ප්‍රාග්ධන සම්පත් ප්‍රමාණය වැඩිවීම සිදුවන්නේ:

(1) ශ්‍රමයේ විශේෂීකරණය තිබෙන විටයි.

(2) නූතන නිෂ්පාදන ශිල්ප ක්‍රම තිබෙන විටයි.

(3) ආර්ථිකයක් එහි ප්‍රාග්ධන තොග වැඩිකරන විටයි.

(4) නිෂ්පාදිත වල ගුණාත්මක බව වර්ධනය වන විටයි.

*ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 සැපයුම වෙනස් නොවී භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම, එම භාණ්ඩයේ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය යන දෙකෙහිම වැඩිවීමට හේතු වේ.

1.12 කතිපයාධිකාරය (oligopoly) යටතේ, වෙළෙඳපොළෙහි නිෂ්පාදකයන් / විකුණුම්කරුවන් සහ ගනුදෙනුකරුවන් විශාල සංඛ්‍යාවක් සිටී.

1.13 වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය තුළ රජයේ මැදිහත් වීම සඳහා ප්‍රධාන හේතුව වන්නේ වෙළෙඳපොළ බිඳවැටීම් නිවැරදි කිරීමයි.

1.14 වෙනත් මුදල් වලට සාපේක්ෂව යම් නිශ්චිත මුදලකට ඇති ඉල්ලුම සහ සැපයුම අනුව විදේශ විනිමය වෙළෙඳපොළ මගින් ස්ථාවර විනිමය අනුපාතය තීරණය කරනු ලබයි.

1.15 රටක තිරසාර සංවර්ධනය මැනීමේදී ආර්ථික අංශය පමණක් සලකා බලනු ලබයි.

*අංක **1.16** සිට **1.20** දක්වා ප්‍රශ්න වල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරා ගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

**1.16** පාරිභෝගිකයන් ඔවුන්ගේ …………………… *(උපයෝගිතාවය / ලාභ)* උපරිම කර ගැනීමට උත්සාහ කරයි.

**1.17** …………………… *(නිෂ්පාදකයන් / පාරිභෝගිකයන්)* ආරක්ෂා කිරීමට රජය විසින් අවම මිල පනවනු ලබයි.

**1.18** සාර්ව ආර්ථික තත්ත්වයන් කෙරෙහි බලපෑම් කරනු ලබන රාජ්‍ය වියදම් සහ ආදායම් ප්‍රතිපත්ති පිළිබඳව …………………… *(රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය / මූල්‍ය ප්‍රතිපත්තිය)* මඟින් සලකා බලයි.

**1.19** රටකට වෙනත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩයක් නිපදවිය හැකි නම්, එය හඳුන්වනු ලබන්නේ …………………… *(නිරපේක්ෂ වාසිය / සාපේක්ෂ වාසිය)* ලෙසයි.

**1.20** සියලුම යෙදවුම් වැඩිවීමට වඩා අඩු අනුපාතයකින් නිමැවුම වැඩිවේ නම්, එය …………………… *(වැඩෙන පරිමාණානුකූල ඵල / හීනවන පරිමාණානුකූල ඵල)* ලෙස හැඳින්වේ.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) (i) ආර්ථිකයක ප්‍රධාන ආර්ථික සම්පත් **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(ii) ආවස්ථික පිරිවැය සංකල්පය උදාහරණයක් සහිතව **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයේ ලක්ෂණ පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ඇතුලත්ව ඇති ආයතන දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) (i) "මූල්‍ය ප්‍රතිපත්තිය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(ii) මූල්‍ය ප්‍රතිපත්තියේ උපකරණ හතරක්(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) "මුදල් සැපයුම" යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) (i) උද්ධමනය සඳහා වන හේතු දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(ii) උද්ධමන අනුපාතිකය වැඩිවීම හේතුවෙන් ශ්‍රී ලංකාව වැනි රටකට ඇතිවන ප්‍රතිවිපාක පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

ආර්ථිකයකට අදාලව වර්ෂයක කාලසීමාවක් සඳහා ජාතික ආදායම සම්බන්ධව පහත සඳහන් දත්ත ඔබ වෙත සපයා ඇත:

| | රු. මිලියන |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product - GDP) සාධක පිරිවැය මිලට | 3,250 |
| වක්‍ර බදු | 175 |
| විදේශ ශුද්ධ සාධක ආදායම | 250 |
| ප්‍රාග්ධන ක්ෂයවීම් | 150 |
| සහනාධාර | 125 |
| අපනයන | 320 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) (i) වෙළෙඳපොළ මිලට, දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product - GDP). (ලකුණු 03)

(ii) වෙළෙඳපොළ මිලට, දළ ජාතික නිෂ්පාදිතය (Gross National Product - GNP). (ලකුණු 02)

(iii) වෙළෙඳපොළ මිලට, ශුද්ධ ජාතික නිෂ්පාදිතය (Net National Product - NNP). (ලකුණු 01)

(b) රටක් විසින් අනුගමනය කරනු ලබන ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු (key macro-economic objectives) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

වෙළෙඳපොළක් යනු ඵලදායී ගනුදෙනුවක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් එකිනෙකා අන්‍යෝන්‍යව ක්‍රියාකරන ස්ථානයයි. භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමෙන් ලබන තෘප්තියෙන් ගැනුම්කරුවන්ගේ හැසිරීම මෙහෙයවනු ලබයි.

**(A)** (a) (i) නිෂ්පාදනය සහ පිරිවැය සම්බන්ධයෙන් "කෙටි කාලය" සහ "දිගු කාලය" අතර වෙනස **සඳහන් කරන්න**. (ලකුණු 04)

(ii) පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී එහි ලාභය උපරිම කරගන්නේ කෙසේදැයි, ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) භාණ්ඩයක් සඳහා පහත සඳහන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඔබ වෙත සපයා ඇත:

$$Qd = 2{,}800 - 25p$$
$$Qs = -200 + 100p$$

| | | |
|---|---|---|
| Qd | = | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය |
| Qs | = | සපයනු ලබන ප්‍රමාණය |
| P | = | මිල |

(i) භාණ්ඩයේ සමතුලිත මිල **ගණනය කරන්න**. (ලකුණු 03)

(ii) භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 02)

**(B)** අන්තර්ජාතික වෙළදාමේ වාසි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙළ අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |